පදනම් කරගත් නිර්ණායක

මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරතුමන් විසින් **2024.07.28** වන දින අනුමත කළ මධ්‍යම පළාත් සභාවට අනුයුක්ත ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ නිලධාරීන් සඳහා වන වාර්ෂික ස්ථාන මාරු ක්‍රියාපටිපාටියේ වගන්ති අංක **06, 07** සහ **10**ට අදාළ සියලු නිර්ණායක පදනම් කර ගන්නා ලදී.

*එමෙන්ම පහත කරුණු කෙරෙහි සැළකිලිමත් වෙමින් නිර්දේශ ලබා දෙන ලදී.

I. **2024.12.31** දිනට වයස අවුරුදු **56** ඉක්මවූ නිලධාරීන් ස්ථාන මාරු නොකිරිම. එනම්, **1968.01.31** දිනට පසු උපන් නිලධාරීන් ස්ථාන මාරු වලට යටත් වේ. (**2026** ජනවාරි මස ස්ථාන මාරු ලබන විට **1966/1967** වර්ෂවල නිලධාරීන් වයස අවුරුදු **58** සපුරා ඇත.)

II. **2025.08.25** දිනැතිව ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලද මධ්‍යම පළාත් විදුහල්පති මාරු පටිපාටියේ සංශෝධන **01**ට අනුව, ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ නිලධාරියෙකු ලෙස එකම සේවා ස්ථානයේ වසර **06**කට වඩා සේවය කොට ඇති නිලධාරීන් ස්ථාන මාරු නිර්දේශවලට යටත් වීම. (**2018.12.31** දිනට පෙර යම් පාසලක වැඩ භාරගෙන ඇති සියලුම නිලධාරීන්)

III. **2025.07.23** දිනැතිව ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමැතිය ලබා දෙන ලද මධ්‍යම පළාත් පාසල්වල විදුහල්පතිවරු පත්කිරීම පිළිබඳ මාර්ගෝපදේශයේ සඳහන් පරිදි විදුහල්පති ශ්‍රේණියට අදාළව පාසල් වර්ගය පදනම් කරගෙන ස්ථාන මාරු නිර්දේශ ලබා දෙන ලදී.

IV. නිලධාරියාගේ ඉල්ලීමට ප්‍රමුඛතාවය ලබා දීම හා පහසුවෙන් රාජකාරී ස්ථානයට ලඟා වීමේ හැකියාව සළකා/ පදිංචි ස්ථානය අනුව ස්ථාන මාරු නිර්දේශ කිරීම සිදු කරන ලදි.

V. ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ නිලධාරියෙකු ලෙස නියෝජ්‍ය විදුහල්පති හෝ සහකාර විදුහල්පති ලෙස සේවය කොට විධිමත් සම්මුඛ පරීක්ෂණයකින් තමා සේවය කළ පාසලටම විදුහල්පති පත්වීමක් ලද නිලධාරියෙක් අවම වසර **3**ක කාලයක් එම පාසලේ විදුහල්පති තනතුර දැරිය යුතු බව තීරණය කර ඇති බැවින් එවැනි නිලධාරීන් ස්ථාන මාරු කිරීමේදී අදාල වසර **03**ක කාලය සපුරා තිබීම පිළිබඳව සළකා බලන ලදී.

VI. ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමැතිය ලබාදුන් විදුහල්පතිවරුන්ගේ පත්කිරීමේ මාර්ගෝපදේශයට අනුව ඇතැම් පාසල්වල විදුහල්පතිවරුන්ගේ ශ්‍රේණියට අනුව පාසල් වර්ගය ලබාදීමට නොහැකි අවස්ථාවල මෙම වර්ෂයට පමණක් සීමාවන පරිදි තාවකාලිකව ස්ථාන මාරු නොකිරීමට තීරණය කරන ලදී.

VII. එකම පාසලේ සහකාර විදුහල්පතිවරයෙකු ලෙස සේවයේ යෙදී සිට සම්මුඛ පරීක්ෂණ මඟින් තමා සේවය කරන පාසලේම නියෝජ්‍ය විදුහල්පති ලෙස විධිමත් පත්වීමක් ලබා කෙටි කාලයක් වුවත්, එකම පාසලේ වසර **06**කට වඩා අඛණ්ඩව සේවය කර ඇත්නම් එම නිලධාරීන් ස්ථාන මාරු කිරීමට නිර්දේශ කරන ලදී.